# සැප්:මාසයේ 0.9%ක් වූ උද්ධමනය ඔක්තෝම්බර් 0.1%කට අඩුවෙලා

## ● ජනතා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**ජයසිරි මුණසිංහ**

මේ වසරේ සැප්තැම්බර් මාසයේ සියයට 0.9ක්ව පැවැති ලක්ෂ්‍යමය උද්ධමනය ඔක්තෝම්බර් මාසයේදී සියයට 0.1ක් දක්වා අඩු වූ බව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අයි. ආර්. බණ්ඩාර මහත්මිය ප්‍රකාශ කළාය.

වසර 2017 ඔක්තෝම්බර් මාසයේදී මේ අනුපාතය සියයට 8.8ක් මට්ටමක පැවැතුණි. මේ පිළිබඳව අදහස් දක්වන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මෙසේද කියා සිටියි.

පසුගිය සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 0.9%ක් ලෙස වාර්තා විය. ඔක්තෝම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -3.04%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.10%ක දායකත්වයක් පිළිවෙළින් ලබාදී ඇත. එහෙත් 2017 ඔක්තෝබර් මාසයේ 8.8%ක් වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 6.4%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.4%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කළ විට 2018 සැප්තැම්බර් මාසයේ 124.4ක් වූ දර්ශකාංකය 2018 ඔක්තෝම්බර් මාසයේ 124.9ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කළවිට 2018 ඔක්තෝම්බර් මාසයේ දර්ශකාංකය 0.5 ක වැඩිවීමක් එනම් 0.4ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය.

මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.03%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.42%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා අලුත් මාළු, බිත්තර, පොල්, පැපොල්, අර්තාපල්, කරවල, කුකුල් මස්, ලොකුලූනු, පොල්තෙල් සහ තිරිඟු පිටි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් දෙහි, එළවළු, සහල්, සීනි, කෙසෙල්, පාන් (සාමාන්‍ය), කුරුඳු, අන්නාසි, අමු මිරිස්, සියඹලා, කොස් මදුළු හා කොස් ඇට සහ සුදුලූනු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2018 ඔක්තෝම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන' 'විවිධ භාණ්ඩ හා සේවා', 'මද්‍යසාර පාන වර්ග, "දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන, "ආපන ශාලා සහ හෝටල්" සහ "රෙදිපිළි හා පාවහන්" යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු යන කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු වැඩිවීමක් වාර්තා විය. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දය කළවිට 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක' හා 'සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් කිසිදු අයිතමයක මිලේ වෙනසක් වාර්තා නොවිය.